# 9 උදාර ගුණ ඇති මිගාර මාතා

මිගාර මාතා නම් බුදු සසුනෙහි අග්‍රදායිකාව වූ විශාඛා උපාසිකාවයි. ඇය මෙණ්ඩක සිටුතුමාගේ මිණිබිරියයි. මෙණ්ඩක සිටුතුමා දඹදිව අංග ජනපදයේ භද්දිය නුවර විසූ මහා ධනවතෙකි. ඔහුගේ පුත් ධනංජය සිටාණන්ගේ හා සුමනා දේවියගේ දියණිය 'විශාඛා' නම් වූවා ය. රූමත් විශාඛා සත් හැවිරිදි වියේ සිටිය දී බුදුරජාණන් වහන්සේ භද්දිය නුවරට වඩින බව මෙණ්ඩක සිටුතුමාට ආරංචි විය.

මෙණ්ඩක සිටාණෝ මිණිබිරිය අමතා මෙ සේ කීහ.

"දුවේ, බුදුරජාණන් වහන්සේ අපේ නුවරට වඩින බව ආරංචියි. දුවත් මිතුරියන් සමග උන් වහන්සේ දකින්නට යනවා නම් හොඳයි නේ ද?"

කීකරු දියණියක වූ විශාඛා සිටු කුමරිය මිතුරියන් පන්සියයක් සමග බුදුරජාණන් වහන්සේ වඩනා පෙරමගට ගියා ය. ඇයට ඇතින් වඩනා බුදුරුව දිස් විණි. ගරු කළ යුත්තන්ට ගරු කිරීමට පුරුදු ව සිටි ඇය, රියෙන් බැස පෙරමගට ගොස් එකත්පස් ව සිටියා ය. එදා දේශනා කළ ධර්මය ඇසූ විශාඛාව ඇතුලු පන්සියයක් කුමරියෝ සෝවාන් ඵලයට පත් වූහ. ඇය සත් හැවිරිදි වියේ දී සෝවාන් වූයේ පෙර පින් කළ තැනැත්තියක වූ නිසාත් ධර්මය තේරුම් ගැනීමට තරම් ප්‍රඥාවක් තිබුණු නිසාත් ය.

**සෝවාන් ඵලය**

> නිවන් මග ගමන් කරන තැනැත්තා නිවන් අවබෝධ කර ගැනීමේ පළමුවන පියවරට එළඹීම. මෙහි දී දස සංයෝජනයන්ගෙන් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා සහ සීලබ්බත පරාමාස යන සංයෝජන තුන ප්‍රහීණ වේ.

මෙණ්ඩක සිටාණෝ ද බුදුරදුන් වෙත ගොස් බණ අසා සෝවාන් වූහ. හෙතෙම බුද්ධ ප්‍රමුඛ සංඝයා වහන්සේට සිටු නිවසේ මහ දන් පැවැත්වී ය. මේ අතර කොසොල් රජතුමාට ධනංජය සිටාණන්ගේ ධනවත්කම ගැන දැනගන්නට ලැබිණි. එතුමා ධනංජය සිටු පවුල ගෙන්වා සාකේත නුවර පදිංචි කරවා ගත්තේය.



ක්‍රමෙන් වැඩුණු විශාඛාව පංච කල්‍යාණයෙන් හෙබි රූමතියක් වූවා ය. ඇගේ කෙස් කළඹ බොලට දක්වා දික් විය. ශරීරාවයවයෝ දුටුවන් නෙත් සිත් ඇද ගත්හ. සුදෝ සුදු දත් දෙපෙළ කොඳකැකුළු මෙන් බැබළිණි. ඇගේ පැහැපත් සිනිඳු සම ලප කැළැල් ආදියෙන් තොර විය. වයඃ කල්‍යාණය ද මොනවට මතු වී පෙනිණි. කෙතරම් රූමත් වුවත්, උඩඟු නො වී, මා පිය වැඩිහිටියන්ට හොඳින් සැලකූ, ගුණ නුවණින් හෙබි විශාඛාව ගැන වෙනත් ප්‍රදේශවල පවා ප්‍රසිද්ධ විය.

මෙකල සැවැත් නුවර මිගාර නම් සිටුවරයෙක් විය. හෙතෙම ආරෝහ පරිණාහයෙන් යුත් 'පූර්ණ වර්ධන' නම් තම පුතුට ආවාහ කර දීමට සුදුසු කුල කුමරියක සිටින තැනක් සොයා ගෙන එන ලෙස දූතයන් පිටත් කර යැවී ය.

මෙම දූතයන් සාකේත නුවරට ළඟාවූයේ එහි සැණකෙළියක් පැවති දිනක දී ය. ඔවුහු ශාලාවක නතර වූහ. එදා විශාඛාව ද මිතුරියන් සමඟ සැණකෙළි බැලීමට ගියා ය.

මේ අතර බලාපොරොත්තු නො වූ මහ වැස්සක් ඇද හැලෙන්නට විය. විශාඛාවගේ මිතුරියෝ ශාලාව වෙත දුව ගියහ. එහෙත් විශාඛාව පියවි ගමනින් වැස්සේ තෙමි තෙමී අවුත්, ශාලාවට ඇතුළු වූවා ය. ශාලාවේ සිටි දූතයෝ එකිනෙකාගේ මුහුණු බලා ගත්හ.

ඔවුහු විශාඛාවගෙන් මෙසේ ඇසූහ. "අනෙක් කුමාරිකාවන් දුවගෙන ආ නිසා නො තෙමී ආවා. ඔබත් කම්මැලි නැතුව දිව්වා නම් නො තෙමී එන්න තිබුණා නේ ද?"

"ලස්සනට ඇඳ පැළඳගත් කාන්තාවක් මහ මඟ දුවන එක හරි අශෝභනයි. විළිබිය ඇති කාන්තාවන් එහෙම දුවන්නේ නෑ. මට ගැළපෙන දෙයක් මිස, නො ගැළපෙන දෙයක් මා කරන්නේ නෑ. අනෙක, දුවන විට, වැටී අතක් පයක් කැඩුණොත් හැමදාට ම මවුපියන්ට බරක් වෙනවා නේ ද?" යනුවෙන් විශාඛාව පිළිතුරු දුන්නා ය.

සැවැත් නුවරට ආපසු ගිය දූතයෝ පූර්ණවර්ධන තරුණයාට ගැළපෙන මනාලියක මුණ ගැසුණ බව මිගාර සිටාණන්ට සැලකළහ. කල් නොයවා ම පූර්ණවර්ධන සිටු කුමරාගේත්, විශාඛා සිටු කුමරියගේත්, විවාහ මංගල්‍යය අති උත්සවාකාරයෙන් සිදු කෙරිණි. ධනංජය සිටුතුමා තම දියණියට මිල මුදල් සහ වෙනත් තෑගි බෝග සමඟ ම, කහවණු නව කෝටියක් වටිනා මහාලතාපසාධන නම් ආභරණයක් ද තෑගි කෙළේ ය.

**මහාලතාපසාධන (මහා මේල පළඳනාව)**

මුතු මැණික් ඔබ්බවා රන් රිදී වැනි ලෝහවලින් නිම කරන ලද කාන්තාවන් පළඳින ඉතා වටිනා ආභරණයකි. මෙම පළඳනාව හිස පටන් පහළට විහිදී යන බවත්, පළඳනාවේ මුදුන නටන මොණරකු වැනි බවත් කියනු ලැබේ. රන් කරුවන් පන්සියයක් දිවා රෑ නොතකා මාස තුනක් තිස්සේ මෙම පළඳනාව තනා නිම කළ බව සඳහන් ය. විශාඛාව වැනි ශක්තිමත් කාන්තාවකට මිස වෙනත් කාන්තාවකට මෙහි බර ඉසිලිය නොහැකි බවත් කියැවේ.

එදා පතිකුලයට ගිය විශාඛාවට, විවාහ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය අගනා අවවාද දහයක් පියාගෙන් ලැබිණ.

1. ඇතුළත ගිනි පිටතට නො දිය යුතු ය.
2. පිටත ගිනි ඇතුළතට නො ගත යුතු ය.
3. දෙන්නවුන්ට දිය යුතු ය.
4. නොදෙන්නවුන්ට නො දිය යුතු ය.
5. දෙන්නාටත්, නොදෙන්නාටත් දිය යුතු ය.
6. සුව සේ හිඳ ගත යුතු ය.
7. සුව සේ අනුභව කළ යුතු ය.
8. සුව සේ නිදාගත යුතු ය.
9. ගිනි පිරිමැසිය යුතු ය.
10. ඇතුළත දෙවියන් වැඳිය යුතු ය.

"ඇතුළත ගිනි පිටතට නො දිය යුතුය" යි කීවේ, තම නැදි මයිලන්ගේ හෝ සැමියාගේ අගුණයක් හෝ දෝෂයක් ඇතොත්, එය ඒ ඒ තැන ගොස් නො කිව යුතු බව ය.

"පිටත ගිනි ඇතුළට නො ගත යුතු ය" යන්නෙහි අරුත, අහල පහළ නිවෙස් වල අය නැදි මයිලන්ගේ හෝ සැමියාගේ නුගුණයක් කීවොත් එය නැදි මයිලන්ට නො කිව යුතු බවයි.

"දෙන්නවුන්ට දිය යුතු ය" යනු, ණයක් දෙනවා නම් ආපසු ලබා ගත හැකි අයට පමණක් දිය යුතු බව ය.

"නොදෙන්නන්ට නො දිය යුතු ය" යි කීවේ, යමකු බඩු බාහිරාදිය වැනි පාරිභෝග වස්තු මෙන් ම ඇඳුම් පැළඳුම් රෙදි පිළි ආදී උපභෝග වස්තු ඇවිටිලි බස් කියා හෝ රැවටිලි බස් කියා, ගෙන ගොස් ආපසු දිය යුතු අවස්ථාවේ දී වංචා සහගත සිතින් නො දී මගහරිත් නම්, එබඳු අයට නො දිය යුතු බව ය.

"දෙන්නාටත් නොදෙන්නාටත් දිය යුතු ය" යන්නෙහි අදහස මෙ සේ ය. දුප්පත් නෑයන් හෝ මිතුරන් යමක් ඉල්වූ කල, එය දුන් පසු, ඔවුන්ගේ දුප්පත්කම නිසා, සමහර විට ආපසු දිය නො හැකි වනු ඇත. ඒ නිසා එබඳු අයට දෙන්නේ නම්, ආපසු ලැබුණත් කම්නැත, නො ලැබුණත් කම්නැතැයි සිතා මැදහත් සිතින් දිය යුතු බව ය.

"සුවසේ හිඳගත යුතු ය" යි කීවේ ගෙදර නැදිමයිලන්, සැමියා හෝ වෙනත් වැඩිහිටියන් නිවසට පැමිණෙන කල ඔවුන්ට අගෞරව වන සේ හිඳගෙන සිටීම නො කළ යුතු බව ය. කවුරුන් ආවත්, නැගිටීමට අවශ්‍ය නො වන ආසනයක වාඩිවී සිටීම මෙයින් අදහස් කෙරේ.

"සුවසේ අනුභව කළ යුතු ය" යන්නෙන් හැඟවූයේ හොඳ පතිනියක නැදිමයිලන්ට හා සැමියාට කළ මනා සිරිත් කොට, ගෙදර අනෙක් අයට කෑම ප්‍රමාණවත් දැයි සොයා බලා කෑම ප්‍රමාණවත් නො වුණා නම්, සුදුසු පරිදි එය පිරිමසා තමන් අනුභව කළ යුතු බව ය.

"සුවසේ නිදාගත යුතු ය" යන්නෙහි අදහස නැදිමයිලන්ට හා ස්වාමියාට ආහාර අනුභව කරවා, ඔවුන්ට වෙනත් අවශ්‍යතා ඇතොත් ඒවා ද ඉටු කර, ගෙදර කටයුතු සොයා බලා පසුව සැතපීමයි.

"ගිනි පිරිමැසිය යුතු ය" යන්නෙහි අදහස, නැදිමයිලන් හා ස්වාමියා ඉතා පරිස්සමින් ඇසුරු කළ යුතු බව ය. ඔවුන් කෝප කරවීම නුසුදුසු බව ය.

"ඇතුළත දෙවියන් වැන්ද යුතු ය." යන්නෙන් අදහස් කරන ලද්දේ තමාගේ සැමියා හා නැදිමයිලන් දේවත්වයෙන් සැලකිය යුතු බවයි.

මෙම අවවාද දහය, නුවණැති විශාඛා තේරුම් ගෙන හොඳින් පිළිපැද්දා ය.

මිගාර සිටුතුමා ජෛන පූජකවරුන්ට ගරු බුහුමන් කළ කෙනෙකි. සිටු මැඳුරට පැමිණි ජෛන පූජකවරුන්ගේ ආකල්ප විශාඛාවගේ සිත් නො ගත්තේ ය. විවාහය නිසා ආගම වෙනස් නො කරන තත්ත්වයක සිටි විශාඛා, එය සහජීවනයට බාධාවක් කර ගත්තේ ද නැත. ඇය සත් අවුරුදු වියේ දී ම සෝවාන් වී සිටි නිසා සිටු මැඳුරට පිඬු සිඟා වඩිනා භික්ෂූන් වහන්සේලාට දානය පූජා කළේ, නැදි මයිලන්ගේත් සැමියාගේත් සිත් නො රිදෙන පරිදි ය. ඇය තම පවුලේ අය මිගාර සිටු පවුලට වඩා ධනවත් වුවත්, එයින් උඩඟු නොවී, අනතිමානී ව ඔවුන්ගේ සිත් දිනා ගත්තා ය. තමා කරන සෑම යහපත් ක්‍රියාවක් ම මයිලණුවන්ගේ අවසරය, අනුග්‍රහ ඇති ව කිරීම ඇගේ සිරිත විය. ඇය බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය මිගාර සිටු මැඳුරට වඩමවා ගැනීමට ද සමත් වූවා ය. දානය පිළිගැන්වූයේ මහත් ශ්‍රද්ධාවෙන් හා ගෞරවයෙනි. මෙතෙක් ජෛන පූජකවරුන්ගේ ඉරියව් දක පුරුදු මිගාර සිටුතුමා, බුද්ධ ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා ගේ ඉන්ද්‍රිය සංවරය, මනා ඇවතුම් පැවතුම් හා දානය වළඳන පිළිවෙළ දක පැහැදුණේ ය. එයින් ඇති වූ ආකල්ප පරිවර්තනය නිසා, මිගාර සිටු පවුල ම බෞද්ධයෝ වූහ. තම සැමියාගේ ඥාතීන්ට, විශේෂයෙන් සිටුවරයාට, නිවැරැදි මග පෙන්වා දුන් විශාඛාවට, මිගාර සිටුතුමා මෑණියනට මෙන් සලකන්නට විය. විශාඛාවට "**මිගාර මාතා**" යන ගෞරව නාමය පටබැඳුනේ එතැන් සිට ය.

විශාඛාව සැමියාට මෙන් ම සැමියාගේ ඥාතීන්ට ද, මැනවින් සංග්‍රහ කළ කාන්තාවකි. ඇය සේවක සේවිකාවන්ට යහපත් ස්වාමි දුවක් වූවා ය. සේවක සේවිකාවන් පවා බණ දහමට යොමු කිරීම, ඇගේ සිරිත විය. පෙහෙවස් සමාදන් වූ දිනවල ඇය, එක් එක් වයස් කණ්ඩායමට අයත් කාන්තාවන් සමඟ වෙන වෙන ම සාකච්ඡා කොට, ඔවුන්ගේ දැනුම සංවර්ධනය කර ගැනීමට මග පාදා දුන්නා ය. ඇය තිරිසන් සතුන්ට ද ආදර කරුණාව දක් වූ කාන්තාවකි. දිනක් රාත්‍රියෙහි, පැටවකු බිහි කළ වෙළඹක වෙත සේවිකාව සමඟ ගොස්, වෙළඹ උණු පැනින් නහවා, තලතෙල් ගැල්වූ බව සඳහන් වේ.

නිතර නිතර බණ දහම් ඇසීමට සහ ස්වාමීන් වහන්සේලාගේ සුව දුක් සොයා බැලීමට ජේතවනාරාමයට යෑම විශාඛාවගේ පුරුද්දකි. දිනක් ඇගේ

මහාලතාපසාධන නම් ආභරණය විහාරයේ අමතක විය. මේ ගැන පසුව දැන ගත් ඇයට තමාගේ පළඳනාව වුව ද, විහාරයේ අමතක වූ නිසා ආපසු ගැනීම නුසුදුසු යැයි සිතිණි. ඇය එම ආභරණයේ වටිනාකමට සමාන මුදල වන කහවණු නව කෝටිය වැයකොට, ආරාමයක් තැනීම සඳහා සැවැත් නුවරට නැගෙනහිරින් ඉඩමක් මිලදී ගත්තා ය. බුද්ධ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට අංග සම්පූර්ණ ආරාමයක් තැනීම සඳහා තවත් කහවණු නව කෝටියක් වැය විය. ඇය මෙම ආරාමය බුද්ධ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට පූජා කිරීමේ උත්සවයට ද තවත් කහවණු නව කෝටියක් වියදම් කළා ය. එම ආරාමය පූර්වාරාමයයි. 'මිගාර මාතු පාසාදය' යනු මෙයට ම තවත් නමකි. බුදුරජාණන් වහන්සේ වස් හයක් ම පූර්වාරාමයේ වැඩ විසූ සේක.

විශාඛා ව නිරන්තරයෙන් පෙරවරු කාලයෙහි භික්ෂූන් වහන්සේලාට දන් පැන් පූජා කළ කාන්තාවකි. පස්වරුවේ රෝගී භික්ෂූන් වහන්සේලාට මවක් මෙන් කැපසරුප් දෑ සැපවූවා ය. භික්ෂූන් වහන්සේලාට ගිලන්පස සැපයීම ද කළා ය. කුඩා සාමණේරයන් වහන්සේලාට රසකැවිලි ගෙන ගොස් පූජා කළා ය. මිගාර මාතා විහාරයට ගිය අවස්ථාවල දී සාමණේර හිමිවරුන් ඇය 'රස කැවිලි කිසිවක් ගෙනවිත් ඇද්දෝ' යි දැන ගැනීම සඳහා ඇගේ අත දෙස විමසිල්ලෙන් බලන්නට වූ බව ද සඳහන් වේ. ඇය නිතර නිතර භික්ෂූන් වහන්සේලාගේ සුව දුක් බැලූ අතර, බණ දහම් අසමින් දැහැමි ජීවිතයක් ගත කළා ය.

මෙසේ බුදුසසුනට කුලුපග දායිකාවක වූ ඇයට, බුදු සසුනේ අග්‍රදායිකා තනතුර හිමිවිය.

වරක් භික්ෂුණීන් වහන්සේ නමක් පිළිබඳ ප්‍රශ්නයක් මතු වූ අවස්ථාවක දී, එය විසඳීමට එතුමියගේ සහාය ලැබිණි. විවාහයෙන් පසු, තමා ගැබ්ගෙන සිටි බව නො දැන, පැවිදි වූ කුමාර කාශ්‍යප මාතා නම් භික්ෂුණීන් වහන්සේ පිළිබඳ ව සැකයක් මතු විය. මේ සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමට පත් කළ උපාලි මහ තෙරුන් ප්‍රධාන කමිටුව විසින් කුමාර කාශ්‍යප මාතාව පරීක්ෂා කර බැලීම පවරන ලද්දේ විශාඛාවට ය. එතුමිය ඉදිරිපත් කළ විස්තර අනුව, කුමාර කාශ්‍යප මාතා භික්ෂුණිය චෝදනාවෙන් නිදහස් වූවා ය.

විශාඛාවගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ රාශියකි. එම මහඟු ගුණ ධර්ම කාන්තා සමාජයේ දියුණුවට හේතු වනු ඇත.

**සාරාංශය**

මිගාර මාතා චරිතය අපේ චරිත හැඩගස්වා ගැනීමට මහෝපකාරී වන ශ්‍රේෂ්ඨ චරිතයකි. මා පිය වැඩිහිටියන්ට කීකරු වීම හැදෙන වැඩෙන දරුවන් පුරුදු කර ගත යුතු ගුණාංගයකි. ගරු කළ යුත්තන්ට ගරු කිරීමටත් රූපය, ධනය හා උගත්කම නිසා අනතිමානී වීමත් සුදුසු ය. සැක සිතන අයට කරුණු පැහැදිලි කරදීමෙන් ප්‍රශ්න ඇති නොවේ. කිසිවකුගේ වරදක්, අඩුපාඩුවක් දූනගත් විට ප්‍රචාරය කිරීමෙන් වැළකීමෙන් සාමය ආරක්‍ෂා වේ. ඥාතීන් සමඟ සහයෝගයෙන් සිටීම මෙන් ම ඔවුන්ට සංග්‍රහ කිරීම ද වැදගත් ය. ගෙදර හැමදෙනාටමත් සේවකයන්ටත් හොඳින් සැලකීම උසස් ගුණ ධර්මයකි. ණය දීමේ දී පරිස්සම් වීමෙන් කාටත් යහපතක් සිදු වේ. විවාහය නිසා තම ආගම වෙනස් නො කිරීම ශ්‍රේෂ්ඨ ගුණාංගයකි. මෙබඳු බොදු පිළිවෙත් අප ද පණ මෙන් ආරක්ෂා කළ යුතු ය.

**ක්‍රියාකාරකම**

පහත වගුවට අනුව විශාඛා චරිතයෙන් ගත හැකි ආදර්ශ තුන බැගින් ලියන්න.

| | |
|---|---|
| තරුණියකට | 1 |
| | 2 |
| | 3 |
| ගෘහණියකට | 1 |
| | 2 |
| | 3 |
| දායිකාවකට | 1 |
| | 2 |
| | 3 |

**පැවරුම**

"කාන්තා චරිත සංවර්ධනයට අත්වැලක්" යන මාතෘකාව යටතේ විශාඛාවගේ චරිතය ඇසුරින් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.